ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය

කොළඹ

****

<u>පුවත්පත් නිවේදනය</u>

ස්වයං මූල්‍යකරණ වැඩසටහන යටතේ 2019-20 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය උපාධිය (MBBS), දන්ත වෛද්‍ය උපාධිය (BDS), අධ්‍යාපනවේදී උපාධිය (BE), තාක්ෂණවේදී උපාධිය (B.Tech), ඖෂධවේදී උපාධිය (B.Pharm) සහ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිය (B. Arch) යන උපාධි පාඨමාලා සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වෙන සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසුන්ගෙන් (ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් (PIO), විදේශීය පුරවැසිභාවය හිමි පුද්ගලයන් (OCI) සහ නේවාසික ඉන්දියානු සහ ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් (NRIs) හැර) ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය අයදුම්පත් කැඳවයි.

2. වෛද්‍ය උපාධිය/දන්ත වෛද්‍ය උපාධිය යන උපාධි පාඨමාලා සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් 2019 මැයි මාසයේ දී, නව දිල්ලියේ පිහිටි ද්විතියික අධ්‍යාපන මහ මණ්ඩලය විසින් පවත්වනු ලබන NEET පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතුය. ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධි පාඨමාලා (B. Arch) අපේක්ෂකයින් නව දිල්ලියේ ගෘහනිර්මාණ කවුන්සිලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

3. අයදුම් පත්, කොළඹ 03 පිහිටි ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ අධ්‍යාපන අංශයෙන් ඕනෑම වැඩ කරන දිනයක පස්වරු 2.00 - 4.00 අතර කාලය තුළ ලබා ගත හැකිය. අයදුම්පත් ලබා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සිය උප්පැන්න සහතිකය, අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික (බත්තරමුල්ලේ පිහිටි අධ්‍යාපන දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද) හෝ ලන්ඩන් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික ඉදිරිපත් කල යුතුය.

4. ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2019 ජුනි 10** වේ.

****

කොළඹ

2019 මැයි 06